# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2016/31 - 2017 අප්‍රේල් මස 26 වැනි බදාදා - 2017.04.26**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත

**4 (2) උපවගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (මෙහි මින් මතු 'ආයතනය' යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, LKAS 40 - ආයෝජන දේපළ ප්‍රමිතය සඳහා වූ සංශෝධන සම්මත කර ඇති අතර, එකී සංශෝධනයන් 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ අරමුණු සඳහා මේ සමඟ පළ කරමි. මෙම සංශෝධන දෙදහස් දහ අටේ ජනවාරි මස පළමුවන දින හෝ ඊට පසු ආරම්භ වන කාල පරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක වේ. ඊට කලින් ව්‍යවහාරකරණය සඳහා ද අවසර දේ.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2017 අප්‍රේල් මස 26 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ දී ය.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## LKAS 40 *ආයෝජන දේපළ සඳහා වන සංශෝධන* - 2018 ජනවාරි මස 01 දින සිට බලාත්මක වේ.

**ආයෝජන දේපළ මාරු කිරීම**

**LKAS 40 - ආයෝජන දේපළ සඳහා වන සංශෝධන**

57 - 58 දක්වා වූ ඡේද සංශෝධනය වේ. නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත. ඉවත් කළ පාඨය ඉරකින් කපා ඇත.

**මාරු කිරීම**

57 **අස්තිත්වයක් විසින් යම් දේපළක් ආයෝජන දේපළකට හෝ ආයෝජන දේපළකින් මාරු කිරීම් කළ යුත්තේ භාවිතයෙහි ඇතිවන වෙනසකදී පමණි. ~~වටිනාකමේ වෙනසක් ඇති බවට පහත සඳහන් දෑ වලින් සාක්ෂි සපයන විටදී පමණි.~~ භාවිතයෙහි වෙනසක් ඇති වනුයේ අදාල දේපළ, ආයෝජන දේපළ සඳහා වන නිර්වචනයට එකඟ වීම හෝ එකඟ නොවීම යන අවස්ථාවලදී සහ භාවිතයෙහි වන වෙනසක් සඳහා වූ සාක්ෂි සපයන විටකදී පමණි. තනිව ගත්කල භාවිතය පිළිබඳ කළමණාකාරිත්ව අභිප්‍රායයන්හි සිදුවන වෙනස් වීමක් භාවිතයෙහි සිදුවන වෙනසක් සඳහා සාක්ෂි සපයනු නොලබයි. භාවිතයෙහි වෙනසක් ඇති බවට වන සාක්ෂි සඳහා උදාහරණ වලට පහත සඳහන් දෑ අන්තර්ගත වේ.**

**(අ) ආයෝජන දේපළක් අයිතිකරු පදිංචිගත දේපළක් බවට මාරු කිරීම සඳහා අයිතිකරුගේ පදිංචිය ආරම්භ කිරීම හෝ අයිතිකරුගේ පදිංචිය අරමුණු කරගනිමින් සංවර්ධනය කිරීම ;**

**(ආ) ආයෝජන දේපළකින් තොගවලට මාරුකිරීම සඳහා විකිණීමේ අරමුණින් සංවර්ධනය ආරම්භ කිරීම ;**

**(ඇ) අයිතිකරු - පදිංචිගත දේපළකින් ආයෝජන දේපළක් බවට මාරු කිරීම් සඳහා අයිතිකරු පදිංචිගතය අවසන් කිරීම ;**

**~~හෝ~~ සහ**

**(ඈ) තොගයෙන් ආයෝජන දේපළක් බවට මාරුකිරීම සඳහා වෙනත් පාර්ශවයකට මෙහෙයුම් කල්බද්දක් ආරම්භ කිරීම ;**

**(ඊ) [ඉවත්කළා]**

58 ~~57 (ආ) ඡේදය අනුව යම් අස්තිත්වයක් විකිණීමේ අරමුණින් සංවර්ධනය කිරීම ආරම්භ කළ බවට සාක්ෂි සපයන භාවිතයෙහි වෙනසක් පවතින විටදී පමණක් දේපළක්, ආයෝජන දේපළකින් තොගයට මාරු කිරීම අවශ්‍ය කෙරේ.~~ අස්තිත්වයක් ආයෝජන දේපළක් සංවර්ධනය කිරීමෙන් තොරව ඉවත් කිරීමට තීරණය කරන විට එම දේපළ හඳුනා නොගන්නා තෙක් (මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් ඉවත් කරන තෙක්) දිගින් දිගටම ආයෝජන දේපළක් වශයෙන් සලකන අතර තොගය වශයෙන් ~~නොසලකයි.~~ ප්‍රතිවර්ගීකරණය නොකරයි. එමෙන්ම අස්තිත්වයක් පවතින ආයෝජන දේපළක්, ආයෝජන දේපළ වශයෙන් අඛණ්ඩ අනාගත භාවිතයක් සඳහා නැවත සංවර්ධනය කිරීම ආරම්භ කරයි නම්, එම දේපළ ප්‍රතිසංවර්ධිත කාලය තුළදී ද ආයෝජන දේපළක් වශයෙන්ම පවතින අතර එය අයිතිකරු පදිංචිගත දේපළක් වශයෙන් නැවත වර්ගීකරණය නොකෙරේ.

84ඇ - 84ඉ දක්වා වූ ඡේද සහ ඒවායේ සම්බන්ධිත ශීර්ෂ පද සහ 85උ ඡේදයද අලුතින් එකතු කෙරේ.

**සංක්‍රාන්තික ප්‍රතිපාදන**

**ආයෝජන දේපළ මාරු කිරීම**

84ඇ 2017 ජනවාරි මස සම්මත කරන ලද *ආයෝජන දේපළ මාරුකිරීම* (LKAS 40 සඳහා වන සංශෝධන) මගින් ඡේද 57 - 58 සංශෝධනය කර ඇත. එම සංශෝධන, මුල් වරට ව්‍යවහාර කළ වාර්ෂික කාලපරිච්ඡේදයේ ආරම්භක දින (මුල් වරට ව්‍යවහාරක දින) හෝ ඊට පසුව සිදුවන භාවිත වෙනස්වීම් සඳහා ව්‍යවහාර කළ යුතුයි. මුල් වරට ව්‍යවහාර කරනු ලබන දිනයේදී එදිනට පවතින දේපළ වර්ගීකරණය නැවත තක්සේරු කළ යුතු අතර අදාල වන්නේ නම් පමණක් එදිනට පවතින තත්වය පිළිබිඹු වන ආකාරයට ඡේද 7 - 14 අනුව ප්‍රතිවර්ගීකරණය කළයුතු වේ.

84ඈ 84ඇ ඡේදයේ කෙසේ සඳහන් කළද, ඡේද 57 - 58 සඳහා වන සංශෝධන LKAS 8 අනුව අතීතයට බලපාන පරිදි අදාල කිරීමට ඉඩදේ. එසේ කිරීමට ඉඩදෙනු ලබන්නේ අපරදෘෂ්ටියෙන් තොරව භාවිතා කරන්නේ නම් පමණි.

84ඉ ඡේද 84ඇ අනුව යම් අස්තිත්වයක්, මුල්වරට ව්‍යවහාර කරනු ලබන දිනයේදී දේපළ ප්‍රතිවර්ගීකරණයක් සිදුකරන්නේ නම් එය පහත පරිදි සිදුකළ යුතුය :

(අ) ඡේද 59 - 64 අවශ්‍යතා ව්‍යවහාර කරමින් ප්‍රතිවර්ගීකරණය සඳහා ගිණුම්ගත කළයුතුය. එසේ ඡේද 59 - 64 භාවිතා කිරීමේදී අස්තිත්වය :

(i) භාවිතයෙහි වෙනසක් ඇතිවන දිනය ලෙස සඳහන් කිසියම් යොමු කිරීමක් වෙතොත් එය කියවිය යුත්තේ පළමුවරට ව්‍යවහාර කරනු ලබන දිනය ලෙසයි.

(ii) ඡේද 59 - 64 අනුව ලාභයේ හෝ අලාභයේ හඳුනාගත යුතුව තිබූ යම් වටිනාකමක් වෙතොත් එය පළමුවරට ව්‍යවහාර කරනු ලබන දිනයේදී පවතින රඳවාගත් ඉපයීම් වල ආරම්භක ශේෂයට ගැලපිය යුතුය.

(ආ) ඡේද 84ඇ අනුව ආයෝජන දේපළ වලට හෝ ආයෝජන දේපළවලින් සිදුකරනු ලබන ප්‍රතිවර්ගීකරණයන්ට අදාල වටිනාකම් හෙළිදරව් කළ යුතුය. ආස්තිත්වය විසින් එසේ ප්‍රතිවර්ගීකරණය කරනු ලබන වටිනාකම් හෙළිදරව් කළ යුත්තේ ඡේද 76 සහ 79 අනුව හෙළිදරව් කරන ආයෝජන දේපළවල ආරම්භක හා අවසාන ශේෂ අතර සැසඳුම තුලය.

**බලාත්මක දිනය**

85උ 2017 ජනවාරි මස ආයෝජන දේපළ හුවමාරු කිරීම (LKAS 40 - සඳහා වන සංශෝධන) සම්මත කර ඇති අතර එමගින් ඡේද 57 - 58 සංශෝධනය කරනු ලබන අතර ඡේද 84ඇ - 84ඉ අලුතින් එකතු කෙරේ. අස්තිත්වයක් විසින් මෙකී සංශෝධනයන් 2018 ජනවාරි මස 01 දින සිට ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා ව්‍යවහාර කළයුතුය. ඊට කලින් ව්‍යවහාර කිරීමට ද ඉඩදේ. එසේ කලින් ව්‍යවහාර කරනු ලබන විට ඒ බව හෙළිදරව් කළයුතු වේ.

05 - 275

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.